# බස්නාහිර පළාතේ 2006 අංක 03 දරණ
# සමාජ සේවා ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වෙනි උපලේඛනයේ 1 වන ලයිස්තුවේ සමාජ සේවා හා පුනරුත්තාපන විෂය යටතේ බස්නාහිර පළාත තුළ පදිංචි අනාථ තැනැත්තන් සහ පවුල් පුනරුත්තපනය කිරීම දිළිඳු සහ අසරණ ජන කොටස් සඳහා සහන සැලසීම, ජිවිකා වෘත්තියක යෙදිය නොහැකි ක්ෂය, පිළිකා, ලාදුරු, තැලිසීමියා රෝගාබාධ සහිත තැනැත්තන් සඳහා ආධාර සැපයීම, කායික මානසික සහ සාමාජික වශයෙන් ආබාධ සහිත තැනැත්තන් පුනරුත්තාපනය කිරීම සහ ඔවුන්ගේ සුභ සාධනය, අබල සහ සේවා නියුත්තියක යෙදි නොහැකි තැනැත්තන්ට සහන සැලසීම, අයාල ආඥා පනත යටතේ අධිකරණය මගින් යොමු කරන කාන්තාවන් රඳවා තබා ගැනීම හා පුනරුත්තාපනය ඇතුළු සුභ සාධන සේවාවන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහාත් එයට අනුශාංගික වු කරුනු වෙනුවෙන් විධිවිධාන සැලැස්වීම සඳහාත් වු ප්‍රඥප්තියකි. 1841 අංක 04 දරන ආයාල ආඥා පනත හා 1907 අංක 05 දරන නිවර්ථන නිවාස ආඥා පනතට මෙම ප්‍රඥප්තිය අනනුකුල වේ. දීර්ඝ නාමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මේ ප්‍රඥප්තිය 2006 අංක 03 දරන බස්නාහිර පළාත් සභාවේ සමාජ සේවා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දිනයේ සිට ක්‍රියාත්මක විය යුතුය. ලුහුඩු නාමය හා ක්‍රියාත්මක වන දිනය

02. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වේ. ප්‍රඥප්තියේ අරමුණු

(අ) බස්නාහිර පළාත තුල පදිංචි, සුභසාධන සේවා සැලසිය යුතු දිළිඳු හා අසරණ පුද්ගලයින්ට ආධාර හා සහන සේවා සැපයීම සහ ඔවුන්ගේ පුනරුත්ථාපනය;

(ආ) කායික මානසික සහ සාමාජිය වශයෙන් ආබාධ සහිත පුද්ගලයින් සහ අසරණ වු වයෝවෘද්ධ පුද්ගලයින් සඳහා රැකවරණය හා පුනරුත්ථාපනය;

(ඇ) කායික මානසික සහ සමාජිය වශයෙන් ආබාධ සහිත පුද්ගලයින් හා වැඩිහිටි තැනැත්තන් සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා නිවාස / ආයතන සඳහා ආධාර ලබාදිම හා ඒවා අධීක්ෂණය;

(ඈ) අයාල ආඥා පනත යටතේ අධිකරණය මගින් යොමු කරන කාන්තාවන්ට රැකවරනය සහ ඔවුන්ගේ පුනරුත්ථාපනය;

03. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටු කිරීම සඳහා බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් පසු දෙපාර්තමේන්තුව වශයෙන් සඳහන් කරනු ලබන) ආයතනයක් මෙයින් පිහිටවනු ලැබේ.

පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම

04. (1) මෙහි මින්මතු "අධ්‍යක්‍ෂ" වශයෙන් සඳහන් කරනු ලබන බස්නාහිර පළාත් සමාජ සේවා අධ්‍යක්‍ෂ මෙහි 3 වන වගන්තිය යටතේ පිහිටවනු ලැබූ දෙපාර්තමේන්තුවෙහි ප්‍රධානියා වන්නේය.

බස්නාහිර පළාත් සමාජ සේවා අධ්‍යක්‍ෂ හා කාර්ය මණ්ඩලය

(2) දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පත් කිරීම, ස්ථාන මාරු කිරීම, සේවයෙන් පහ කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම සහ වෙනත් අනුශාංගික කරුණු සම්බන්ධයෙන් 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ විධිවිධාන අදාල වන්නේය.

05. මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා කර්තව්‍යයන් පහත සඳහන් පරිදි වේ.

දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා කර්තව්‍යයන්

(අ) දිළිඳු පවුල්වල අය සඳහා මහජනාධාර මාසික දීමනා ගෙවීම,

(ආ) දිළිඳු පවුල්වල ක්‍ෂය රෝග, පිළිකා, තැලිසිමියා හා ලාදුරු රෝගීන් සඳහා ආධාර ගෙවීම,

(ඇ) අනියම් වශයෙන් ආපදා වලට ලක්වී අනාථ භාවයට පත්වූ තැනැත්තන්ට සහ පවුල් වලට සහන සැලසීම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම,

(ඈ) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වැඩිහිටි නිවාස ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ ඔවුන් පුනරුත්තාපනය කිරීම,

(ඉ) ආබාධ සහිත හා මනස සෙමෙන් වැඩෙන පුද්ගලයින් සඳහා නිවාස ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම,

(ඊ) අයාල ආඥා පනත යටතේ අධිකරණය මගින් යොමු කරන කාන්තාවන්ට රැකවරණය සැලසීම සහ පුනරුත්ථාපනය කිරීම,

(උ) සහන අපේක්‍ෂා කරන දිළිඳු පවුල්වල ආබාධ සහිත පුද්ගලයින්ට ඇස් කණ්නාඩි, ශ්‍රවන උපකරණ, රෝද පුටු, ත්‍රියිසිකල්, අත්වාරු, කිහිලිකරු, අක්‍ෂිකාච ආදිය සැපයීම,

(ඌ) වැඩිහිටි පුද්ගලයින් සහ ආබාධ සහිත පුද්ගලයින් නේවාසිකව තබාගෙන ඔවුන් රැකබලා ගන්නා ලියාපදංචි වී සිටින ස්වේච්ජා සංවිධාන ආයතන සඳහා නඩත්තු ආධාර සහ යථායෝග්‍යාධාර ලබාදීම එවැනි සේවා සපයන ආයතන සඳහා සාමුහික ආධාර ලබාදීම හා එම ආයතන අධීක්‍ෂණය කිරීම.

(එ) සාමාජීය වශයෙන් අසරණ භාවයට පත්ව සිටින පත්වීමට ඉඩ ඇති පවුල් හෝ තැනැත්තන් සඳහා පුනරුත්තාපන සේවා සැපයීම.

(ඒ) සමාජයේ විවිධ හේතූන් නිසා මානසිකව පීඩාවට ලක් වූ හෝ ලක්වීමට ඉඩ ඇති තැනැත්තන් හෝ පවුල් සඳහා උපදේශන සේවා සැපයීම, එමගින් ඔවුන් පුනරුත්ථාපනය කිරීම හා ඒ සඳහා උපදේශන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම.

(ඔ) ඉහත 2 වගන්තියේ අරමුණු වලට අදාල විශේෂ අධ්‍යයන, සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම.

06. (1) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් කාර්යයන් හා අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන තොරතුරු හෝ වාර්තා සමාජ සේවා අධ්‍යක්ෂ විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන අයෙකු විසින් යම් ආයතනයකින් හෝ පුද්ගලයකු විසින් ඉල්ලා සිටියහොත් ඔහු විසින් හෝ එම ආයතනය විසින් අධ්‍යක්ෂ වෙත එම තොරතුරු ලබාදිය යුතුය. දෙපාර්තමේන්තුවේ බලතල

(2) බස්නාහිර පළාත තුළ පවත්වාගෙන යනු ලබන ඕනෑම වැඩිහිටි නිවාසයකට, ආබාධ සහිත පුද්ගලයන් සඳහා පවත්වාගෙන යන නිවාසයකට හෝ සමාජ සේවා කටයුතු සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන ආයතයනයකට සමාජසේවා අධ්‍යක්ෂ හෝ සමාජසේවා අධ්‍යක්ෂ විසින් විශේෂයෙන් බලය පවරන ලද යම් නිලධාරියෙකුට කලින් දැනුම් දීමකින් තොරව ඕනෑම වේලාවක ඇතුල්වීමට හා මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා යම් පරීක්ෂා කිරීමක්, විභාග කිරීමක්, විමර්ශනය කිරීමක් හෝ සමීක්ෂණයක් පැවැත්වීමට එම කාර්ය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි ලේඛන පරීක්ෂා කිරීම, තොරතුරු ලබා ගැනීම, අවශ්‍ය ලිපි ලේඛන ලබා ගැනීම ඇතුළු යම් ක්‍රියාවක් කිරීමට බලය ඇත.

07. අංක 05 වගන්තිය යටතේ දැක්වෙන කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත තුළ ස්වේච්ඡාවෙන් පවත්වාගෙන යනු ලබන නිවාස හා සේවා සපයනු ලබන ආයතන සියල්ල බස්නාහිර පළාත් සමාජසේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වියයුතු අතර, විදේශීය රාජ්‍ය නොවන සංවිධානයක් මගින් පවත්වාගෙන යන නිවාසයක් හෝ ආයතනයක් නම්, සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශයේ රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ මහ ලේකම් කාර්යාලයේ ලියාපදිංචිවීමෙන් අනතුරුව බස්නාහිර පළාත් සමාජසේවා දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි විය යුතුය. ප්‍රඥප්තියේ සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන නිවාස / ආයතන ලියා පදිංචි විය යුතු බව.

08. මෙම ප්‍රඥප්තියේ 02 වන ඡේදයේ සඳහන් අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා "බස්නාහිර පළාත් සමාජ සේවා අරමුදල" නමින් ගිණුමක් ආරම්භ කොට පවත්වාගෙන යා හැකිය. බස්නාහිර පළාත් සමාජ සේවා අරමුදල් ගිණුම

8.1 මෙම අරමුදල් ගිණුමට පහත සඳහන් මුදල් බැර කළ යුතුය.

(අ) රජයේ මුදල් ආධාර වශයෙන් වරින්වර ප්‍රදනය කරනු ලබන මුදල්,

(ආ) බස්නාහිර පළාත් සභාව විසින් අරමුදල් ගිණුමේ කාර්ය සඳහා සම්මත කරනු ලබන මුදල්,

(ඇ) පළාත් සභා පනතේ 22 වගන්තිය යටතේ රජය විසින් ලබා දෙන විදේශීය ආධාර වශයෙන් ලැබෙන සියළුම මුදල්

(ඈ) සංදර්ශන, ලොතරැයි හා වෙනත් සම්මත ක්‍රම වලින් ලබා ගන්නා සියළුම මුදල්

(ඉ) දේශීය හෝ විදේශීය යම් පුද්ගලයකු හෝ ආයතනයක් හෝ සංවිධානයක් මගින් කෙරෙන පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළුම මුදල්

8.2 මෙම ප්‍රඥප්තියේ අරමුණු මුදුන්පත් කර ගැනිම සඳහා දරනු ලබන වියදම් මෙම අරමුදලින් ගෙවිය යුතුය.

8.3 එසේ වුවද, යම් නිශ්චිත කාර්යයන් සඳහා යෙදවිය යුතුය යන කොන්දේසිය මත ඉහත (1 වන) උප වගන්තියේ (ඇ), (ඈ) සහ (ඉ) ජේද යටතේ මුදලක් ලැබුනු අවස්ථාවක එම මුදල් අරමුදලේ ගිණුමේ බැරට බාර ගැනීම අමාත්‍යවරයාගේ අභිමතය පරිදි විය යුතුය.

8.4 අමාත්‍යවරයාගේ අභිමතය පරිදි පත් කරනු ලබන මණ්ඩලයක් යටතේ අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව අරමුදල් ගිණුම පවත්වාගෙන යාමේ වගකිම අමාත්‍යාංශ ලේකම්වරයා සතුය. අමාත්‍යවරයෙකු නොමැති අවස්ථාවකදි ලේකම්වරයාට අදල බලතල ක්‍රියාත්මක කිරීමට බලය පැවරේ. අරමුදල් ගිණුම පාලනය කිරීම

8.5 අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය. අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය

8.6 (1) රාජ්‍ය ආයතන වල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ විධිවිධාන හා බස්නාහිර පළාත් සභාවේ මුල්‍ය රීති මෙම අරමුදල් ගිණුමේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදල විය යුතුය. අරමුදල් ගිණුමේ මුදල් විගණනය

(2) අමාත්‍යවරයා විසින් ලිත් වර්ෂය අවසන් වී මාස 06 ක් ඇතුළත එකී ලිත් වර්ෂය සඳහා වු අරමුදල් ගිණුමේ පරිපාලනය ගැන වු වාර්තාවක්ද විගණනය කරන ලද එම වර්ෂයේ ගිණුමේ පිටපතක්ද එම ගණන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපතක්ද සභාගත කළ යුතුය. අරමුදල් ගිණුම පිළිබඳ වාර්තා

09. මෙම ප්‍රඥප්තියේ සඳහන් පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා පිහිටුවා ගනු ලබන අරමුදල් ගිණුම පරිපාලනය කිරීම සඳහා සාමාජිකයන්ගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් සමාජ සේවා විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කළ යුතුය. භාරකාර මණ්ඩලය පත් කිරීම.

(අ) පළාත් සභාවේ සමාජ සේවා විෂය භාර ලේකම් - සභාපති,

(ආ) පළාත් සභාවේ සමාජ සේවා අධ්‍යක්ෂ

(ඇ) පළාත් සභාවේ මුල්‍ය කළමනාකරණ පිළිබඳ නියෝජ්‍ය ලේකම්

(ඈ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වඩාත් සුදුසු වෙනත් පුද්ගලයින් දෙදෙනෙක්

9.1 මෙහි 9 වන ජේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයෙකුගේ නිල කාලය අවුරුදු 03 ක් වන අතර, එම කාලය ඉකුත්වීම නිසා සාමාජිකත්වයෙන් ඉවත් වන තැනැත්තෙකු නැවත පත්වීම සඳහා සුදුස්සෙකු විය හැකිය.

9.2 මණ්ඩලයේ යම් සාමාජිකයෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වුවහොත් හෝ එවැනි තනතුරකට පත්වුවහොත් එසේ පත් වන දින සිට ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වීමට නුසුදුස්සෙකු වන්නේය.

9.3 ඉහත 09 යටතේ පත් කරන ලද මණ්ඩලයේ ගණපූරණය තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

9.4 මෙම මණ්ඩලයට පත් කරන ලද සාමාජිකයෙකු යම් උසාවියකදී වැරදිකරුවෙකු වේ නම් හෝ යම් විෂමාචාර ක්‍රියාවක් හෙළිදරව් වීම හේතුවෙන් හෝ වැරදිකරුවෙකු වුවහොත් විෂයභාර අමාත්‍යවරයා විසින් ඔහුව/ඇයව සාමාජිකත්වයෙන් ඉවත් කළ යුතුය.

## 11 කොටස

## වරදවල් හා දණ්ඩන

10. යම් තැනැත්තෙකු,

මෙම ප්‍රඥප්තියේ නියමයන් හෝ ඒ යටතේ පනවනු ලබන යම් නියෝගයක් කඩකිරීම හෝ පැහැර හැරීම හෝ නොසලකා හැරීම හෝ මෙම ප්‍රඥප්තිය හෝ ඒ යටතේ පනවන නියෝග අනුව යම් කාර්යයන් පැවරී ඇති තැනැත්තෙකුට එම කාර්යය කිරීමට අවහිර කිරීම හෝ මෙහි දක්වා ඇති සේවාවන් ලබාගැනීම සඳහා සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම හෝ කළහොත් ඒ තැනැත්තා මෙම ප්‍රඥප්තිය යටතේ වරදකරුවෙකු වන්නේය.

10.1 මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන යම් නියෝගයක් කඩකිරීම හෝ පැහැර හැරීම හෝ නොසලකා හැරීම හෝ මෙම ප්‍රඥප්තිය හෝ ඒ යටතේ පනවන නියෝග අනුව ක්‍රියාත්මක නොවන යම් ආයතනයක් ඇත්නම් එම ආයතනය අමාත්‍යවරයා විසින් අත්හිටවිය යුතුය.

11. මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කරන සෑම තැනැත්තෙකුටම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් වරදකරුවෙකු කරනු ලබන කල්හි රු.5,000 ක දඩයකට හෝ මාස 06 කට නොවැඩි කාලයකට බන්ධනාගාර ගත කිරීම හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතුය.

## *111 වන කොටස*

## පොදු විධිවිධාන

12.1 නියම කලයුතු යයි මේ ප්‍රඥප්තිය මගින් නියමිත හෝ නියෝග සෑදීමට මේ ප්‍රඥප්තිය මගින් බලය දී ඇති හෝ අවශ්‍ය විය හැකි සියළුම කාරණා සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය. අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි බව

12.2 අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකළ යුතු අතර එය පළකරනු ලැබීමේ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතුය.

12.3 අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු මාස 03 ක් ඇතුලත අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී අනුමැතියේ දින සිට එහෙත් එකී නියෝගය යටතේ කලින් කරන ලද ක්‍රියාවකට ඉන් හානියක් නොවන පරිදි පරිච්ජින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

12.4 යම් නියෝගයක් පරිච්ජින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

13. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටවන ලද ආයතන වල නඩත්තු උදෙසා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම හා වැය කිරීම සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අදාල වන්නේය. දෙපාර්තමේන්තු කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන ආධාර

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියේ

"අමාත්‍යවරයා", යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ සමාජ සේවා විෂය

පැවරී ඇති අමාත්‍යවරයාද,

“අධ්‍යක්ෂ“ යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනත යටතේ බස්නාහිර පළාතට පත් කර ඇති සමාජ සේවා අධ්‍යක්ෂවරයාද,

“අනියම් ස්වභාවයේ ආපද“ යන්නෙන් පුළුල්ව පැතිරී නොගිය පුද්ගලයෙකුට පාලනය කරගත නොහැකි හේතු නිසා සිදු වන ස්වභාවික සුළු හානි,

“ආබාධිත“ යන්නෙන් ඇසීම් හෝ පෙනීම් හෝ කථාවේ හෝ ඌනතාවය, චලන අපහසුතා, මානසික ආබාධිත තත්ත්වයක් හෝ වෙනත් ශාරීරික ආබාධ සහිත බවද,

“දිළිඳු“ යන්නෙන් ස්වකීය ජීවනෝපාය සඳහා එදිනෙද ජීවිතයට මූලික වශයෙන් හා ආධාර දෙනු නොලැබුවහොත් ජීවිතය පවත්වාගෙන යාමට නොහැකි වූ පුද්ගලයෙක්ද,

“අරමුදල“ යන්නෙන් මෙම ප්‍රඥප්තියේ 08 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන අරමුදල,

“මහජනාධාර“ යනු ආදයම් මාර්ගයක් නොමැති දිළිඳු වයෝවෘද්ධ රෝගී ශාරීරික හා මානසික ආබාධ සහිත පුද්ගලයින් සඳහා මාසිකව දෙනු ලබන ප්‍රදානය යන්නද,

“ස්වේච්ඡා“ යන්නෙන් පුරවැසි කණ්ඩායම් විසින් ස්වේච්ඡා පදනමක් මත පිහිටවුන ලද වූද,

1. ආණ්ඩුවේ නොවන ස්වභාවයක් ඇත්තා වූද ස්වකීය කර්තව්‍යයන් කරගෙන යාමේදි මහජන සම්මාදම් මුදල්, දයක මුදල් ආණ්ඩුව විසින් ගෙවනු ලබන ආධාර මුදල් හා දේශීය විදේශීය පරිත්‍යාග මත යැපෙන්නන්ද,

2. මානසික හෝ ශාරීරික දුබලතාවයකට පත්වූවන්, දිළින්දන්ද, අනාථයින් හා අසරණයින් සඳහා අවශ්‍ය වන සහනාධාර සහ බාහිර හා නේවාසික සේවාවන් සැපයිමේදි, ස්වභාවික ව්‍යසනවලදි සහනාධාර සැපයිම ද ස්වකීය ප්‍රධාන අරමුණු ලෙස ඇත්තාවූද යම් සංවිධානයක්

අදහස් වේ,

15. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනකුලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.